# රත්නාවලී විශ්‍රාන්තිය

එම්.පී.තක්ෂිලා මාරසිංහ

යුධ කළ රජකුට රට කරවීමට අවකාශ ලැබෙනුයේ කලාතුරකිනි. යුධ කළා වුත් රට කළා වුත් රජෙකුට සාහිත්‍ය සේවයෙහි යෙදීමට තරම් භාග්‍යයක් හිමිවන්නේ ඉතා කලාතුරකිනි. මේ දුබල ගණයේ භාග්‍යය හිමි කර ගත්තෙක් ශ්‍රී හර්ෂදේව රාජාධි රාජය. ශ්‍රී හර්ෂ දේවයන්ගේ රාජ සභා කවියා වු ''භාණ'' විසින් රචිත ''හර්ෂදේව චරිතය''සත් වැනි වසේ විසු සුප්‍රකට චීන දේශ සංචාරකයකු වු 'හ්‍යු සාං' භික්ෂුවගේ 'භ්‍රමණ වෘත්තාන්'' සොන්පත තඹ මුද්‍රාව ධාන්ස්කේරා සන්නස සහ මධුබාන් සන්නස මේ අධිරාජ්‍යයා පිළිබඳ වැදගත් තොරතුරු රැසක් පිළිබිඹු කර දක්වන කැඩපතක් වැන්න. රත්නාවලිය නම් කෘතියේ ශ්‍රී හර්ෂදේව රජතුමා ඇතුළු රට වැසියාගේ පැවති විශ්‍රාන්තිය මනාව අවබෝධ කරගත හැකිය.

''වැඩි විස්තරයෙන් කමක් නැහැ. අද මේ වසන්ත උත්සවයට නොයෙක් දිසාවන්ගෙන් පැමිණ සිටින ශ්‍රී හර්ෂදේව රජතුමාගේ යටත් රජවරු මට මෙහෙම කියනවා. ''අපේ හර්ෂදේව රජතුමා අපුරුසන්දර්භයකින් යුක්ත රත්නාවලි නම් අලංකාර නාට්‍යයක් රචනා කරලා තියනවා.'' ඒ නිසා මම ගිහින් නළු නිළියන් වෙස් ගන්වලා අනිකුත් වැඩ කටයුතු පිළියෙල කරන්න ඕනෑ....'' මම දැන් ගෙදර ගිහින් බිරිඳටත් කියලා ගායන වාදන හේම පයටන් ගන්න ඕනෑ....'' මේ රජවරු සේවම ඉන්නේ රත්නාවලි බිසව බලන්ඩ ආසාවෙන් ඉක්මනට වෙස් ලාගෙන සුදානම් වෙන්ඩ....'' කන්චන මාලා මකරන්ද උයනට යන්ඩ පාර පෙන්වන්ඩ මෙහෙන් යහපත් වෙන්ඩ බිසවුන් වහන්ස මෙහෙන් යහපත් වෙන්ඩ....'' කාංචනමාලා අපි පුද පූජා කරන්ඩ යන අංගන රූපය තියෙන රත් අසෝක ගහ ළඟ තව හුඟක් දුරද සාගරිකා සේරම සේවිකාවෝ මදන මහෝත්සවයට ගිහිල්ලා ඉන්දැද්දි මොකද සැළලිහිණියා තනියම දාලා අවේ? යන්ඩ ඔය පූජෝපකරණ කඤ්චනමාලා අතට දීලා ඉක්මනට යන්ඩ. මේ රටෙන් අනංගයා පුදනනේ පිය රජතුමාගේ අන්තඃපුරයේවිදිහටමද කියලා බලන්ඩ මට හරි ආසයි. හැංගිලා ඉදගෙනවත් බලන්ඩ ඕනෑ. පූජාව පැවත්වෙන අතර මමත් අනංග දෙවියන් පුදන්ඩ මල් කඩන්ඩ ඕනෑ ....'' මම දැක්කා අන්න සාගරිකා චිත්‍ර ඵලකයකුයි තෙලිකුරු පෙට්ටියකුයි අරගෙන නිකං හිතේ වේදනවෙන් වගේ කෙහෙල් උයනට ඇතුළු වුනා ....''මදන මහෝද්තවයන ආපු අනංගයා ඔබ හරි චිත්‍රකාරියක්නේ ඒ උණාට මොකද මේක අසම්පූර්ණ ....'' කණගාටු වෙන්න එපා මිතුරිය කනගාටු වෙන්න එපා මම ගිහින් අර පොකුණේ නෙළුම් කොළයි දඬුයි ඉක්මනට කඩාගෙන එන්නම්....'' නෙළුම් කොළ හා දඬු කඩාගෙන ඉක්මනින් පෙරලා අවුත් නෙළුම් කොළවලින් සයනක්ද දඬුවලින් මාලයක්ද තනා ඉතිරි කොළ සාගරිකාගේ ....'' රජතුමනි කෙහෙල් උපන තමයි මේ තියෙන්නේ. අපි යමු ඇතුළට ....'' ඌ ගිහිල්ලනේ අපි ඉතින් මේ සිහිල් සුළඟින් සෙලවෙන කෙහෙල් දළුවලින් හෙණ වුනු ගල් ලැල්ල උඩ ඉඳන් විවේක ගනිමු....'' ස්වාමි පුත්‍රයාණෙනි, දැසමන් වැලේ උඩ ඉඳගෙන විවේක ගනිමු. ....''මේ තියෙන්නේ නෙළුම් කොළයි දඬුයි අරගෙන හදාපු යහනාවකුත්........සුසංගතත් මගේ වෙස් අරගෙන බිසවුන් වහන්සේ වගේ ජේන්ඩ අන්දවගෙන , සුසංගතත් මගේ වෙස් අරගෙන භවහට චිත්‍ර ශාලාව ළඟට එනවයි කියල.........බිසවුන් වහන්සේට පෙන්නන්නේ බොරු ලෙඩක්නෙ. අන්න රජතුමා දන්ත තොරණේ මතුමාලට වෙලා ඉන්නවා. අපි ගිහින් බිසවුන් වහන්සේට.........නැගිටින්ඩ වසන්තක. ඈ එනකල් අපි අර මාධවී ලතා මණ්ඩපයට ගිහින් බලා ඉදිමු? මේ තියෙන්නේ මකරන්ද උයනයි. ගස් වැල් වල වදුල නිසා අන්ධකාරෙ හරියට කැටි වෙලා වාගෙ පාර ජේන්නෙත් නෑ......ඔය ඇහෙන්නෙ මී මැස්සන්ගෙ හඬත් , දෑ සමන් මල්වල සුවඳත් එනවා. කකුලටත් දැනෙනව මරකත මැණික් පියගැට පෙළ. අපි දැන් මාධවී ලතා මණ්ඩපයට ඇවිත්ල. මම ගිහින් බිසවුන් වහන්සේගෙ.......මගේ ප්‍රියාව කැඳවාගෙන එනකල් මම මේ මරකත මැණික් වේදිකාව මත ඉඳගෙන ඉන්ඩ ඕනෑ.......අර චිත්‍ර ශාලාව ළඟ ඉන්න වසන්තකගෙන් ම ඔබ වහන්සේට.......බිසවුන් වහන්ස, මේ තියෙන්නේ චිත්‍ර ශාලාවයි. මම වසන්තකට සංඥාවක් කරන්නම්.......රජතුමා බිසවුන් වහන්සේගෙ මාලිගාවේ ඉඳලා පළිඟු මණ්ඩපයට ගියා. ඔබ තුමත් යන්ඩ.......උදේනි නුවරින් සර්ව සිද්ධි කියලා ඉන්ද්‍ර ජාලිකයෙක් ඇවිත් ඉන්නවා. බිසවුන් වහන්සේ කිවුවා ඔබ වහන්සේ ළඟට ඔහු එක්ක එන්ඩ කියල. අපි ඉන්ද්‍රජාල බලන්ඩ බොහොම ආසයි. ඉක්මනට එක්ක එන්ඩ...... මේ ඉන්ද්‍රජාලිකයා එව්වේ දේවියයි. මෙතන සෙනඟත් නැහැ. ඒ නිසා දේවියට කියන්ඩ ඉන්ද්‍රජාල බලන්ඩ එන්ඩ කියල.........

රත්නාවලිය නම් කෘතියේ ශ්‍රී හර්ෂදේව රජතුමා ඇතුළු රට වැසියාගේ විශ්‍රාන්ති රටා අධ්‍යනයට මෙම කෘතිය පෙර වදනක් බව කිව හැකිය.